**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව - 2023**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (“කොමිෂන් සභාව”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාවේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවේ ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| නොසැපයූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රක්ෂණයේ හර මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක භාවය තක්සේරු කිරීමට සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමට එම මූලධර්ම තීරණාත්මකව වැදගත් වේ. IAIS හි සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා සාමාජික ගාස්තුව ලෙස රු.5,999,664ක් ගෙවා තිබුණි. 2021 වර්ෂයේ විගණනයේදී කොමිෂන් සභාව විසින් රක්ෂණයේ හර මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනාගැනීම සඳහා තොරතුරු ඉල්ලා තිබුණද, විගණිත දිනය වූ 2024 අගෝස්තු 9 වන දිනය දක්වා ඉල්ලා සිටි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රක්ෂණයේ හර මූලධර්ම (ICPs) 1, 2, 9 සහ 10 මගින් බොහෝ දුරට තක්සේරුව නිරීක්ෂණය කෙරේ. වර්තමානයේ ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් පිළිගත් රක්ෂණයේ හර මූලධර්ම (ICPs) 25ක් පවතී.<br><br>රක්ෂණ පනතට සංශෝධන සිදු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලද කමිටුවක් මගින් රක්ෂණයේ හර මූලධර්ම (ICPs) සියල්ල පිළිබඳ සමාලෝචනයක් සිදු කෙරේ. මෙම සමාලෝචන අවසන් වූ පසු, එම සමාලෝචන බෙදා ගනු ලැබේ.<br><br>රක්ෂණයේ හර මූලධර්ම (ICPs) 1-4 පිළිබඳ අදහස් දැක්වීම් සහ ඉදිරිපත් කිරීම් රක්ෂණ නියාමන කොමිෂන් සභාවට (IRCSL) ලබා දී ඇත. කමිටුව විසින් ඒකාබද්ධ කරන ලද රක්ෂණයේ හර මූලධර්ම (ICPs) සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.<br><br>රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 වර්ෂයේ දී රක්ෂණයේ හර | ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) මගින් සංවර්ධනය කරන ලද රක්ෂණයේ හර මූලධර්මවලට (ICPs) අනුකූල වීමට නිර්දේශ කර ඇති අතර කළමනාකාරීත්වය විසින් විගණනය සඳහා ඉල්ලා ඇති තොරතුරු කඩිනමින් ලබා දිය යුතුය. |

මූලධර්ම (ICPs) 10 ක් සහ 2025 වර්ෂයේ දී ඉතිරි රක්ෂණයේ හර මූලධර්ම (ICPs) සමාලෝචනය කිරීමට සැලසුම් කරයි.

එකී කමිටුව විසින් සමස්ත රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටින අතර, අදාළ රක්ෂණයේ හර මූලධර්ම (ICPs) සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් නීති (උදා. මූල්‍ය ව්‍යාපාර පනත, මහ බැංකු පනත ආදිය) සහ වෙනත් රටවල නීති (අධිකරණ බලය) සැලකිල්ලට ගනිමින්, රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ සංශෝධන මෙම කමිටුව විසින් කොටසින් කොටස සිදු කරනු ලැබේ.

රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) මගින් 2024 වර්ෂය අවසානය වන විට, රක්ෂණයේ හර මූලධර්ම (ICPs) 10 ක පරතර විශ්ලේෂණය සම්පූර්ණ කරනු ඇත.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රජය සතු ව්‍යවසාය සඳහා 2021 ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.2.2 (අ.) (i.) | කොමිෂන් සභා රැස්වීම්වලදී නිසි පටිපාටිකරය අනුගමනය කරන බවට සභාපතිවරයා විසින් සහතික විය යුතුය. කෙසේ වුවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛනය අනුව රැස්වීම් කටයුතු සඳහා පටිපාටිකරය සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් සපයා නොතිබුණි. | කොමිෂන් සභා රැස්වීම් රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතට අනුකූලව පවත්වනු ලැබේ. පනතේ පළමු උපලේඛනයේ 8 (1) ඡේදය මගින් මණ්ඩල පටිපාටිකර විශේෂයෙන් සඳහන් කර ඇති අතර එවැනි අවශ්‍යතා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) මගින් අනුගමනය කරනු ලැබේ.<br>තවද, 2022 අගෝස්තු 16 වන දින පැවති 223 වන රැස්වීමේදී පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ රැස්වීම් කාර්ය සටහන් ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොතක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. | පටිපාටිකරය සඳහා ලේඛනගත ප්‍රතිපත්තිය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) රජය සතු ව්‍යවසාය සඳහා 2021 ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ වල 2.6 මාර්ගෝපදේශ ය | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ප්‍රධාන වශයෙන් එහි වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට මඟ පෙන්වීම සඳහා වගකිව යුතු අතර ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ කර්මාන්තයේ මනා පරිචයන්ට අනුකූලව සියලු ක්‍රියා පටිපාටි අනුගමනය කරන බවට සහතික විය යුතුය. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා මාර්ගෝපදේශයෙහි දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් ලබා තිබිය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නිරතව සිටින කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මණ්ඩල අනුකමිටුවල ලේකම් ලෙස කටයුතු කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාවේ සුදුසුකම් ලත් ලේකම්වරයෙකු නොසිටියි. දැනට විමර්ශන අධ්‍යක්ෂවරයා කොමිෂන් සභාවේ ලේකම් ලෙස කටයුතු කරන අතර මාර්ගෝපදේශයට පටහැනිව සහකාර අධ්‍යක්ෂ - නීති ඔවුන්ගේ ස්ථිර වගකීම්වලට අමතරව විගණන කමිටුවේ ලේකම්වරයා ලෙසද කටයුතු කරයි. | යෝජනා සඳහා ඉල්ලීම (RFP) ඉහළම විගණන සමාගම් පහ වෙත යවන ලදී. යෝජනාව යැවීමේ අවසාන දිනය 26/09/2023 විය. කෙසේ වුවද, අපගේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) වෙත කිසිදු යෝජනාවක් ලැබී නොමැත. 2023 සැප්තැම්බර් 27 වැනි දින පැවැත් වූ කොමිෂන් සභාවේ 239 වැනි රැස්වීමේදී මේ බව කොමිෂන් සභාවට දැනුම් දෙන ලද අතර කොමිෂන් සභාවේ සාමාජිකයින් නීති සමාගම්, ලේකම් කාර්යාල සහ විගණන ආයතන වෙත අයදුම්පත් කැඳවීමේ දිනය දීර්ඝ කරන ලෙස උපදෙස් දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) මගින් යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවන ලදී. කෙසේ වුවද, අයදුම්පතක් ලැබී නොමැත.<br>කරුණු සලකා බලන ලද කොමිෂන් සභාව මගින්, 24 ජනවාරි මස 18 දින පැවැති 246 වැනි කොමිෂන් සභා රැස්වීමේදී, නෛතික පසුබිමක් සහිත අධ්‍යක්ෂ විමර්ශන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ලෙස පත් කිරීමට තීරණය කර ඇත. | මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව, අවශ්‍ය සුදුසුකම් සහිත ලේකම්වරයකු පත් කළ යුතු අතර එම ලේකම්වරයා කොමිෂන් සභාවේ අනුකමිටුවල ලේකම්වරයා ලෙස ද කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය | විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීම සඳහා බැංකු හරහා ණය ලබා දීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකු සඳහා වාහන ණය වශයෙන් කොමිෂන් සභා අරමුදල්වලින් සියයට 4.2 ක | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) මගින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තියට අනුව සකස් කරන ලද, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිපාලන අත්පොතට අනුකූලව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | කොමිෂන් සභාවේ සේවකයින්ගේ ප්‍රතිලාභ තීරණය කිරීමේදී කොමිෂන් සභාව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

| | |
|---|---|
| පොළී අනුපාතයකට රු.1,000,000 ක් ලබා දී ඇත. | (IRCSL) කටයුතු කරයි. වාහන ණය යෝජනා ක්‍රමය පරිපාලන අත්පොතෙහි කොටසකි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 194,444,641ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප අතිරික්තය රු. 155,220,568 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 39,224,073ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හේතු වූයේ වාර්ෂික ගාස්තු වැඩි වීම සහ අලුත් කිරීමේ ගාස්තු ආදායම රු. 28,498,045 කින් ඉහළ යෑම, රු. 5,061,291 ක ප්‍රදානය පිළිගැනීම සහ සමාලෝචිත වර්ෂය තුළ පොළී ආදායම රු. 22,816,797කින් වැඩිවීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | මුදල (රු.) | | | | | වෙනස් වීමේ ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
| **ආදායම** | | | | | | | | | | |
| ප්‍රතිමිලදී ගැණුම් සහ කෙටිකාලීන ගිණුමේ පොළිය | 12,444,405 | 16,437,636 | 6,893,783 | 479,514 | 3,698,834 | -24% | 138% | 1,338% | -87% | 9,9% |
| භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය මත පොළිය | 31,099,450 | - | - | - | - | 100% | - | - | - | - |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 34,979,369 | 1,231,844,234 | 515,764,257 | 588,341,378 | 477,484,713 | -15% | 139% | -12% | 23% | 33% |
| **වියදම්** | | | | | | | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 132,146,344 | 127,680,340 | 127,134,065 | 109,096,963 | 112,323,915 | 3% | 0.5% | 17% | | 42% |
| කොමිෂන් සභා සාමාජිකයන් - කොමිෂන් සභා රැස්වීම් සඳහා සහභාගී වීමේ දීමනා | 1,333,560 | 1,754,354 | 1,384,859 | 865,972 | 540,000 | 24% | 27% | 60% | 60% | 2% |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 1,730,359 | 867,855 | 4,459,324 | 2,038,778 | 841,693 | 99% | -81% | 119% | 142% | -28% |
| කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය | 2,937,423 | 2,785,293 | 2,328,894 | 2,001,327 | 1,615,932 | 7% | 20% | 16% | 24% | 45% |
| කාර්ය මණ්ඩල පුහුණුව දේශීය සහ දායක මුදල් | 2,978,644 | 1,168,025 | 921,188 | 401,492 | 1,610,639 | 155% | 27% | 129% | -75% | 27% |
| ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම | 1,246,709 | 744,985 | 1,796,425 | 1,673,310 | 1,218,344 | 67% | -59% | 7% | 37% | 77% |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 1,223,906 | 1,560,693 | 2,764,004 | 2,413,783 | 3,406,080 | -22% | -44% | 15% | -29% | 106% |
| මහජනතාව දැනුවත් කිරීම | 7,249,465 | 8,570,966 | 1,814,843 | 1,459,568 | 9,834,508 | -15% | 372% | 24% | -85% | 309% |
| කාර්යාල උපකරණ නඩත්තුව ඉලෙක්ට්‍රොනික දත්ත සැකසීම සහ වෙනත් | 3,885,948 | 2,969,581 | 2,103,839 | 3,298,073 | 2,107,863 | 31% | 41% | -36% | 56% | 21% |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනාව | 4,550,000 | 4,487,603 | 4,570,890 | 3,166,986 | 3,246,712 | 1% | -2% | 44% | -2% | 4% |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනාව | 3,469,420 | 3,364,460 | 1,356,590 | 1,030,514 | 1,066,755 | 3% | 148% | 32% | -3% | 6% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය  වර්ෂ පහ සඳහා කොමිෂන් සභාව සහ කර්මාන්තය සඳහා ගණනය කරන ලද ප්‍රධාන අනුපාත පහත දක්වා ඇති පරිදි වේ.

| **කොමිෂන් සභාව** | **2023** | **2022** | **2021** | **2020** | **2019** |
|---|---|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වර්ධනය | 19% | 10% | 12% | 19% | 24% |
| වාර්ෂික සෙස් ආදායමේ වර්ධනය | 9% | 8% | 7% | 3% | 3% |
| සෙස් ආදායම දළ ලිඛිත වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.23% | 0.22% | 0.23% | 0.24% | 0.25% |
| වාර්ෂික ගාස්තු ආදායමේ වර්ධනය | 9% | 11% | 5% | 9% | 33% |
| වාර්ෂික ගාස්තු ආදායම දළ ලිඛිත රක්ෂණ වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.11% | 0.11% | 0.11% | 0.12% | 0.11% |
| **කර්මාන්තය** | | | | | |
| දළ ලිඛිත වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 1.01% | 1.07% | 1.38% | 1.39% | 1.27% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් රු. බිලියන | 1,087 | 947.3 | 879.8 | 789.7 | 689.6 |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම්වල වර්ධනය | 15% | 8% | 11% | 15% | 14% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් මූල්‍ය අංශයේ මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 3.27% | 3.02% | 3.29% | 3.37% | 3.44% |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| අ.) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 03 වැනි වගන්තියේ කොමිෂන් සභාවේ අරමුණු සහ වගකීම් දක්වා ඇත. පනතේ 05 වැනි වගන්තියේ කොමිෂන් සභාව සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කළ යුතු කාර්යයන් සහ කර්තව්‍යයන් සඳහන් කරයි. කොමිෂන් සභාවේ කාර්යසාධනය සහ පරිපාලනයේ පහසුව සඳහා කොමිෂන් සභාව විසින් මූල්‍ය හා පරිපාලන, අධීක්ෂණ, විමර්ශන, නීති, ජීවගණක සහ අලෙවිකරණය යන දෙපාර්තමේන්තු 06ක් ස්ථාපනය කර ඇත. කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තු අන්තර් සම්බන්ධිතව කටයුතු කළ යුතු අතර රක්ෂණ සමාගම් සහ කර්මාන්තය සම්බන්ධයෙන් පොදු තොරතුරු බෙදා ගත යුතුය. කෙසේ වුවද, පනතේ අරමුණු ඉටු කිරීම සඳහා, කොමිෂන් සභාව සඳහා ඒකාබද්ධ තොරතුරු බෙදාගැනීමේ පද්ධතියක් සකස් කර නොතිබුණි. | නියාමන තොරතුරු තාක්ෂණ පද්ධතිය නැවත සැලසුම් කිරීම සඳහා අයවැය වෙන් කර ඇත. තවද, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ මඟපෙන්වීම අනුව, වෙබ් පාදක තොරතුරු රැස් කිරීමේ ද්වාරය සංවර්ධනය කර ඇත. එය එහි නියමු මට්ටමේ පවතී. මේ අතර, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) මගින් නියාමන කටයුතු සඳහා පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | කොමිෂන් සභාව සඳහා ඒකාබද්ධ තොරතුරු හුවමාරු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. |
| ආ) | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) අධීක්ෂණ අත්පොතට අනුව, රක්ෂණකරුගේ අවදානම තක්සේරු කිරීමේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම භාවිතා කරමින් අවදානම් පාදක ආකෘතිය හරහා අංශය වෙත ප්‍රවේශ වී ඇත.<br><br>ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) අධීක්ෂණ අංශයේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිලාභ මත පදනම්ව රක්ෂණ සමාගම්වල අවදානම් න්‍යාසයක් නිර්මාණය කරන ලද අතර, 2023 ජූනි 30 න් අවසන් වන කාර්තුවේදී නිර්ණය 1, RBC ප්‍රමිත සහ ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් වැනි නියාමන | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 අගෝස්තු මාසයේ සිට වසර දෙකක කාලයක් සඳහා Willis Towers Watson වෙතින් උපදේශන ජීවගණකවරුන් පත් කරන ලදී. ඒ අනුව, ඔවුන්ගේ එක් කර්තව්‍යයක් වන්නේ, 2024 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කර 2026 මාර්තු මාසයේදී අවසන් කිරීමට නියමිත 2015 වර්ෂයේ විසඳුම් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති සංශෝධනය කිරීමට සහාය වීම සහ ඒ සඳහා පහසුකම් සැලසීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රක්ෂණ සමාගම් සඳහා වාර්ෂික සහ කාර්තුමය ආකෘති ඇතුළුව නියාමන කොන්දේසි ඒ අනුව යාවත්කාලීන කෙරේ.<br><br>2023 මැයි 11 දින 232 වැනි කොමිෂන් සභා රැස්වීමේදී ලබාගත් අනුමැතියෙන් | රක්ෂණකරුගේ අවදානම තක්සේරු කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම භාවිතා කරමින් අවදානම් පාදක අධීක්ෂණ ආකෘතිය අනුගමනය කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතාවලට අනුකූල නොවීම යනාදී පරාමිතීන් ඇතුළත් විය. මෙම අවදානම් න්‍යාසය 2023 දෙසැම්බර් 07 දින කොමිෂන් සභා පත්‍රිකා අංක 244 / 3/2 හි කොටසක් වශයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.<br>කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් මේ වන විටත්, RBC රීති වැනි රීති මූලික අධීක්ෂණ ආකෘතියක් අනුගමනය කරන අතර අවදානම් පාදක ආකෘතියට අමතරව මෑතකාලීනව යාවත්කාලීන නොකළ වාර්ෂික සහ කාර්තු වාර්තා නීති ලබා ගන්නා බව නිරීක්ෂණය විය. | පසුව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ප්‍රතිලාභ සමඟින් ආරම්භ වී අවදානම් පාදක ප්‍රවේශයක් භාවිතා කරමින් කාර්තුමය ප්‍රතිලාභ පිළිබඳ ස්ථානයෙන් පරිබාහිර සමාලෝචනයක් අංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.<br><br>ඒ අනුව පවත්වන ලද සමාලෝචන ඇසුරින් අවදානම් න්‍යාසය මත පදනම්ව, සමාගම් "ඉහළ" "මධ්‍යස්ථ-ඉහළ" සහ "අඩු" අවදානම් ලෙස වර්ගීකරණය කර ඇත. අධි අවදානම් සහිත සමාගම් කාර්තු හතර සඳහාම පුළුල් සමාලෝචනයකට භාජනය වන අතර මධ්‍යස්ථ අවදානම් සහිත සමාගම් ද කාර්තු හතර සඳහාම පුළුල් සමාලෝචනයකට භාජනය වේ. මධ්‍යස්ථ අවදානම් සහිත සමාගම් එක් කාර්තුවකදී පමණක් පුළුල් ලෙස සමාලෝචනය කරනු ලබන අතර සෑම කාර්තුවක් සඳහාම ඉතිරි ප්‍රතිලාභ සඳහා සීමිත සමාලෝචනයක් සිදු කරනු ලැබේ. | |
| ඇ) | ජාතික රක්ෂණ භාර අරමුදල සියයට 30ක ප්‍රතිරක්ෂණය කළ කොටස් සමඟ නියාමනය කළ ප්‍රතිරක්ෂණකරුවෙකු ලෙස වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ජාතික රක්ෂණ භාර අරමුදල ව්‍යාපාරික ස්ථානයේ දී සහ ඉන් පිටත දී යන අවස්ථා දෙකෙහිම අධීක්ෂණය කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රති-රක්ෂණ ක්‍රියා පටිපාටි පිළිබඳව කිහිප වතාවක්ම අවධානය යොමු කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ප්‍රතිරක්ෂණය පිළිබඳ රෙගුලාසි හෝ මාර්ගෝපදේශ බලාත්මක කරමින් ජාතික රක්ෂණ භාර අරමුදල නිතිපතා අධීක්ෂණය කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නොතිබුණි. | ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණ ආවරණයක් නොමැතිව කටයුතු කිරීම මත රක්ෂණ කර්මාන්තයට මුහුණ දීමට සිදු වන අවදානම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>1. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2023 ජනවාරි 31 වැනි දිනෙන් ඇරඹෙන කාලසීමාව සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් ආවරණය අලුත් කිරීමේ තත්ත්වය පිළිබඳව විමසීමක් සිදු කරමින් 2023 පෙබරවාරි 27 වැනි දින (යොමුවය: IRCSL/DG/SUP/2023/02/050) ලිපියක් යවන ලදී.<br><br>2. එතැන් සිට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් පහත ඉස්මතු කර දක්වා ඇති පරිදි, නව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ප්‍රතිරක්ෂණය පිළිබඳ මාර්ගෝපදේශ සහ රෙගුලාසි නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

ප්‍රතිරක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සමීපව අධීක්ෂණය කරයි.

I. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) ලිපියට ජාතික රක්‍ෂණ භාර අරමුදලේ පිළිතුර (යොමුව: NITF/REI/2023/02/80) මගින් දක්වා ඇති පරිදි, ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් 2023 මාර්තු 17 වැනි දින නව ප්‍රතිරක්ෂණ ආවරණය සඳහා ලංසු විවෘත කිරීමට සැලසුම් කර තිබුණි.
II. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ජාතික රක්‍ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාරයේ වටිනාකමට අදාළ වන විභව අවදානම් නිරාවරණය සම්බන්ධයෙන් ජාතික රක්‍ෂණ භාර අරමුදලේ පත් කරන ලද ජීවගණකවරයාගෙන් විමසමින් 2023 ජුනි 2 වන දින තවත් ලිපියක් (යොමුව: IRCSL/DG/SUP/2023/06/209) යවන ලදී.
III. ජාතික රක්‍ෂණ භාර අරමුදල මෙම ආවරණය සඳහා ප්‍රතිරක්ෂක සමාගමෙන් ලංසු ලබා ගැනීම සඳහා නැවත ටෙන්ඩර් ක්‍රියාවලියක් සිදු කරමින් සිටි බැවින්, 30% අනිවාර්ය ප්‍රතිරක්‍ෂණ පවරා දීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් ආවරණය අලුත් කිරීමේ තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් වැඩිදුර විමසුම් (යොමුව: IRCSL/SUP/2023/06/321) සිදු කරන ලදී.
IV. අංක IRCSL/SUP/2023/06/321 දරන ලිපිය සඳහා ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙතින් ප්‍රතිචාරයක් නොලැබුණු බැවින්, ශ්‍රී ලංකා

රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2023 ජූලි 19 වැනි දින සිහිකැඳවීමක් (යොමුව: SUP/2023/07/ 363) නිකුත් කරන ලදී.

2023 ජූලි 28 වැනි දින ලැබුණු පිළිතුරට අනුව, ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්ෂණ ආවරණය 2023 සැප්තැම්බර් 1 වන දින ආරම්භ වන බව දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් ප්‍රකාශනය - ගිවිසුම්, ලේඛන සාක්ෂි සහ අනෙකුත් අදාළ ලේඛන සමඟ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. (යොමුව: IRCSL/SUP/2023/08/396).

V. FMIRB වෙතින් ලැබී තිබුණු තහවුරු කිරීමක් අමුණමින්, 2023 ඔක්තෝබර් 03 වන දින ජාතික රක්‍ෂණ භාර අරමුදල මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) වෙත ලිපියක් ලැබී තිබුණි. එහි සඳහන් වූයේ FMIRB විසින් Best Meridian International Insurance Company SPC (BMI) වෙතින් 30% ප්‍රතිරක්ෂණ ආවරණය 100%ක් සාර්ථකව ලබා ගෙන ඇති බවත්, FMIRB මෙම ආවරණය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජාතික රක්‍ෂණ භාර අරමුදලේ අනුමැතිය අපේක්ෂා කරන බවත්ය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් මෙම ඉදිරිපත් කිරීමද සමාලෝචනය කර ඇත.

VI. කෙසේ වුවද, 2023 නොවැම්බර් 07 දින අංක 23/2032/604/144-I දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුම අවලංගු කරන ලද බැවින්, ප්‍රතිරක්ෂණ ගිවිසුම ලබා දී නොමැත. පසුව, ශ්‍රී ලංකා රක්ෂණ

නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 වර්ෂයේ දී විශේෂ අධ්‍යයනයක් පවත්වන ලද අතර ජාතික රක්‍ෂණ භාර අරමුදල සඳහා ස්ථානීය පරීක්ෂණ තුනක් පැවැත්වීම මත පදනම් වූ ක්‍රියාකාරකම් මාලාවක් (2012, 2015 සහ 2022 වර්ෂවලදී පවත්වන ලද) සහ Ernst & Young (EY) විසින් පවත්වනු ලබන විශේෂ විගණනයක් පැවැත්වීමට ද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) නියාමන විෂය පථය යටතේ ජාතික රක්‍ෂණ භාර අරමුදල අන්තර්කරණය කිරීමෙන් පසුව කලින්කල බාහිර සමාලෝචන සිදු කර නිරීක්ෂණ ලබා ගැනීමට ද නිර්දේශ කරන ලදී.

ඉහත සඳහන් කළ පරිදි, මෙම කාරණය සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී ජාතික රක්‍ෂණ භාර අරමුදල සමඟ අදහස් හුවමාරු කර ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සමත් වී ඇත.

නිර්දේශ කර ඇති ක්‍රියාමාර්ගවලට අනුව, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය පිරිහීමට පත් වෙමින් පවතින බව සැලකිල්ලට ගෙන සුදුසු ප්‍රතිරක්ෂණ ගිවිසුමක් ක්‍රියාත්මක වන තෙක් සහ ජීවගණකවරයා විසින් රඳවා ගැනීමේ සීමාවක් නිර්දේශ කරන තෙක්, 30% අනිවාර්ය ප්‍රතිරක්ෂණය සඳහා තාවකාලික තහනමක් පැනවීමට කොමිෂන් සභාව විසින් 2024 ඔක්තෝම්බර් 30 වන දින මුදල් අමාත්‍යාංශය (MOF) වෙතින් ඉල්ලා ඇත. 30% පිළිබඳ ගැසට් පත්‍රය අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇත.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) නීතිපතිවරයාගේ මතය මත පදනම් වෙමින්, කොමිෂන් සභාව විසින් එහි සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය තීරණය කර ඇත. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගැළපීම, සේවක සංඛ්‍යා සංශෝධනය, රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ගෙවීම, මූලික වැටුපෙන් සියයට 15 ක නිපුණතා දීමනාවක් ගෙවීම සහ 2018 ජූලි 01 දින සිට රු.12,500 ක විශේෂ ජීවන දීමනාවක් ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට යටත් ආයතනයක් වුවද, කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාව ලබාගෙන නොතිබුණි. | 2024.01.10 දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දීම සිදු කර තිබුණි.<br>i) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 5 (ඉ) වගන්තිය අනුව, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම.<br>ii) මේ පනත යටතේ යථා පරිදි මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීමට 5(ඌ) වගන්තිය මගින් තවදුරටත් කොමිෂන් සභාවට බලතල ලබා දී ඇත.<br>iii) 10 (1) සහ (2) වගන්ති මගින් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පත්වීම්, පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි තීරණය කිරීමට කොමිෂන් සභාවට බලය පවරයි. | සේවක සංඛ්‍යාව තීරණය කිරීම සහ වැටුප් හා දීමනා වැඩි කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාව ලබා ගැනීමට නිර්දේශ කෙරේ. |
| (ආ.) 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 ට සහ යහපාලන මාර්ගෝපදේශයට පටහැනිව, එමෙන්ම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන නීතිපතිවරයාගේ මතය මත 2019 වර්ෂයේදී කොමිෂන් සභාවේ වැටුප් සියයට 12.98 සිට සියයට 59.73 දක්වා වැඩි කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ භාණ්ඩාගාර නියෝජිතයා තම පාලන කාලය තුළ මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය මණ්ඩලය වෙත දැනුම් දී මහජන යහපත තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024.01.10 දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දීම සිදු කර තිබුණි.<br>i) රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 5 (ඉ) වගන්තිය අනුව, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම.<br>ii) මෙම පනත යටතේ ඇති බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් භුවමාරු කර ගැනීම, ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි අනෙකුත් සියලුම කටයුතු සිදු කිරීමට 5(ඌ) වගන්තිය මගින් තවදුරටත් කොමිෂන් සභාවට බලය ලබා දෙයි.<br>iii) 10 (1) සහ (2) වගන්ති මගින් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පත්වීම්, පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි තීරණය කිරීමට කොමිෂන් සභාවට බලය පැවරී ඇත. | සේවක සංඛ්‍යාව තීරණය කිරීම සහ වැටුප් හා දීමනා වැඩි කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාව ලබා ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | |
|---|---|---|
| (ඇ.) 2010 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.60,506,093ක කාර්යසාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි. | නව කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය 2024.03.25 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලදී. | කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. |
| (ඈ) දිරි දීමනා යෝජනා ක්‍රමයට අනුව, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 වර්ෂයේ සිට මාස එකක (01) මූලික වැටුපක දිරි දීමනා ගෙවීමේ පදනම මාස එකහමාරක (1 ½) දළ වැටුප ලෙස වෙනස් කර තිබුණි. මෙම වැඩි කිරීම මූල්‍යනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය සඳහා රු.14,102,183ක් වැය කර තිබුණි. | නව කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය 2024.03.25 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලදී. | කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. |
| (ඉ.) පනතට අනුව අධීක්ෂණ සහ නියාමන කාර්යයන් ඉටු කිරීම සඳහා රක්ෂණ සම්බන්ධ දැනුම සහ ජීවගණක දැනුම සහිත සුදුසුකම් ලත් වෘත්තිකයන් කොමිෂන් සභාව සතුව නොමැත. 2016 වර්ෂයේදී ජීවගණක තනතුර අනුමත වුවද, එම තනතුර තවමත් හිස්ව පවතී. | ජීවගණක සහ රක්ෂණ කුසලතා සම්බන්ධ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා සිදු කළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. අමාත්‍ය මණ්ඩල උපදේශක ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර ඇත. අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත 2024.05.09 දින අමාත්‍යාංශයට යවා ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ. | කොමිෂන් සභාවේ කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා රක්ෂණය සම්බන්ධ දැනුම සහ ජීවගණක දැනුම සහිත සුදුසුකම් ලත් වෘත්තිකයන් කොමිෂන් සභාව සතුව සිටිය යුතුය. |
| (ඊ) 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 මගින් සහ රජය සතු ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3 වැනි වගන්තිය මගින්, සියලුම අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වැළකී සිටිය යුතු බවට උපදෙස් දී තිබුණි. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, 2023 වර්ෂය තුළ එක් (01) අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවන්/සහකාර කළමනාකරුවන් දහතුනක් (13) සහ ලේකම් තනතුරු එකක් (01) පුරවා ඇත. | කොමිෂන් සභාව විසින් තනතුරු 57ක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා රක්ෂණ කොමිෂන් සභාව (IRCSL) වෙත සිදු කරනු ලබන සියලුම නව බඳවා ගැනීම් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත සිදු වේ.<br>2023 ජූලි 05 වැනි දින PED 01/2021 ප්‍රකාරව මුළු සේවක සංඛ්‍යාවට බලපෑමක් සිදු නොවන උසස් කිරීමේ ශ්‍රේණිවලට සේවකයින් පත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දී ඇත.<br><br>ශ්‍රී ලංකා රක්ෂණ කොමිෂන් සභාවේ (IRCSL) නිලධාරීන් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා තිබුණි. | වැටුප් හා සේවක සංඛ්‍යා සංශෝධන සඳහා කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

**4. වගවීම සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාව විසින් 2023 වර්ෂය සඳහා වරලත් ගණකාධිකාරී සමාගමක් ඔවුන්ගේ අභ්‍යන්තර විගණකවරයා ලෙස පත් කර ඇත. කෙසේ වුවද, විගණන දිනය වූ 2024 පෙබරවාරි 02 වැනි දින වන විට අභ්‍යන්තර විගණනය මගින් ආවරණය කර තිබුණේ සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව පමණි. | අභ්‍යන්තර විගණකවරුන් විසින් අධීක්ෂණ අංශයේ ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කර තිබුණි. | අභ්‍යන්තර විගණනය මගින් මුළු මූල්‍ය වර්ෂයම ආවරණය කළ යුතු අතර අභ්‍යන්තර විගණන කටයුතු කොමිෂන් සභාව සඳහා ආරක්ෂාව සැපයීමට හැකි ප්‍රමාණයට විස්තීර්ණ විය යුතුය. |